

හුණුපිටියේ ගංගාරාමය

## ⁜ මවු පදවියට සදහම් ප්‍රවේශයක්

– දෙස්තර උපාලි මාරසිංහ
ගැබිනි මවුවරුන්ගේ චර්යා පිළිවෙත් ධර්මානුකූල වීමේ වැදගත්කම. මවු කුසකින් උපත ලබන දරුවාට – ගර්භණී සමයේ දී – මවගේ දැහැමි සිතිවිලි නිසා ඇතිවන ජීව විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක බල–පෑම.

## ⁜ සොඳුරු ඇසුර ගෙනෙයි ඉසුර

– තෙරිපැහැ සෝමානන්ද හිමි
මිතුරු ඇසුර – පුද්ගලයාගේ ආධ්‍යාත්මික හා භෞතික දියුණුවට බලපාන අන්දම. ඒ අනුව මිතුරන් හඳුනාගැනීම හා ඇසුරු කිරීම පිළි–බඳ නිවැරැදි අවබෝධයක් ඇති කරවන බුදු වදනෙහි ඇතුළත් උප–දෙස් කිහිපයක් පිළිබඳ අර්ථ කථනයක්, නවම් පුර පසළොස්වක පෝද ධර්ම දේශනාවෙන්.

## ⁜ සුදුස්සාට සුදුසු තැන් පිරිනැමූ නවම් පෝදා අසිරිය

නවම් පුර පසළොස්වක පොහොය දිනක බුදුරදුන් – තම ශ්‍රාවකයන් අතරින් ගුණ – නුවණින් ඉතා උසස් වූ 'සාරිපුත්ත' සහ 'මොග්ගල්–ලාන' නම් වූ ශ්‍රාවකයන් දෙදෙනා – තමන්ගේ 'අග්‍ර ශ්‍රාවකයන් දෙදෙනා' බව ප්‍රකාශ කරමින් – සෙසු ශ්‍රාවක භික්ෂූන්ට ආදර්ශයක් ගත හැකි අයුරෙන් උන් වහන්සේගේ ගුණ – නුවණ ප්‍රකට කරමින් අදාළ ශාසනික කාර්යභාරය පැවරූ ඓතිහාසික සිද්ධිය පිළිබඳ තොරතුරු ඇතුළත් ලිපියකි.

## ⁜ මග – ඵල ලැබීම සිහිනයක් නොවේ – 14

– දෙලොස්වල උදිතධීර හිමි
'මාර්ග – ඵල' නමින් බුද්ධ දේශනාවෙහි දැක්වෙන උසස් බුද්ධි මට්ටම් වලට පැමිණීමට අවශ්‍ය පිළිවෙත් මාර්ගය දහම තුළ පැහැදිලි ලෙස දක්වා ඇති බවත් – එය, ඇතැම් අය සිතන තරම් අසීරු කටයුත්තක් නොවන බවත් පැහැදිලි කැරෙන ලිපි පෙළක දහහතර වැනි ලිපිය.

## ⁜ යහපත් සමාජයක් සඳහා වූ පුද්ගල කාර්යභාරය

– බී. ඒ. විමලසේන
සමාජය සෑදී ඇත්තේ 'පුද්ගලයන්' නමැති ඒකක සමූහයක් එක්–වීමෙනි. එසේම 'මිනිසා' යනු අනෙක් සතුන්ටත් වඩා – බෙහෙවින් සමාජශීලී සත්වයෙකි. ඒ අනුව මිනිසාගේ නිරවුල් සමාජ සම්බන්–ධතා තහවුරු වීමටත්, ඒ තුළින් ඔහුගේ ජීවිතයට පොදු ප්‍රගතියක් ලබාදීමටත් ඉවහල් වන්නා වූ ධාර්මික මග පෙන්වීම කෙබඳු එකක් ද යන පැනයට මෙම ලිපියෙන් පිළිතුරු සැපයීමට ලේඛකයා උත්සාහ දරයි.

## ⁜ සඟ පරපුර හික්මවූ කළමනාකරණ ක්‍රමෝපාය

බුදුරදුන් – තමන් විසින් බිහි කරන ලද සඟ පරපුර විමුක්ති මඟෙහි නිසි ලෙස හික්මවීමටත්, ඒ තුළින් මිනිස් සමාජය වෙත සත්‍යයේ පණිවිඩය දයාද කිරීමටත් භාවිතා කරන ලද මනෝ විද්‍යාත්මක හා සමාජ විද්‍යාත්මක කළමනාකරණ ක්‍රමෝපාය පිළිබඳ විමර්ශනයකි.

## ⁜ පධාන සූත්‍රය

– වටගෙදර විමලබුද්ධි හිමි
'සූත්‍ර ධර්ම විවරණ' යටතේ – බුදුරදුන්; තමන් බෝධිසත්ව අවධියේ දී විමුක්තිය ලබාගැනීම සඳහා අත්හදා බැලූ දුෂ්කර ක්‍රියා පිළිවෙත ගැන ඉදිරිපත් කළ දේශනාවක් පිළිබඳ විමර්ශනාත්මක ලිපියකි.

## ⁜ The footprint of the Buddha

_by Aryadasa Ratnasinghe

## ඎ කොළොම්පුර නවම් පෙරහර විශේෂ අතිරේකය

### ගංගාරාමයෙන් සැලසෙන බොදු සේවාව

නවම් පසළොස්වක පෝය දිනය නිමිති කරගෙන කොළඹ හුණුපිටිය ගංගාරාම විහාරස්ථානය මගින් පවත්වනු ලබන සුප්‍රකට 'නවම් මහ පෙරහර' පිළිබඳ තොරතුරු ඇතුළත් අතිරේක විශේෂාංගයකි. ගංගාරාම විහාරස්ථානයෙන් සිදු කැරෙන වෙනත් විවිධ ශාසනික මෙහෙවර ගැන ද තොරතුරු කිහිපයක් මෙම අතිරේකයට ඇතුළත් ය.

## ඎ අභයගිරි ථූපය

– නිශාන්ත චමින්ද පීරිස්

'චාරිකා සටහන්' විශේෂාංගය යටතේ අනුරපුර පුද බිම තුළ පිහිටි ශ්‍රී ලංකාවේ ඉපැරැණි චෛත්‍යයක් වන; 'අටමස්ථාන' ලෙස ශ්‍රී ලංකාවේ සුප්‍රකට සිද්ධස්ථානවලින් එකක් වන අභයගිරි චෛත්‍යය පිළිබඳ ඓතිහාසික හා ශාසනික තොරතුරු ඇතුළත් ලිපියකි.

## ඎ සරු ආකල්පවලින් පිරිපුන් සමාජයක් කරා.....

– තිස්සමහාරාමයේ පුණ්ණ හිමි

රටක අනාගතය යහපත් එකක්වීම සඳහා ගුරු – සිසු සබඳතා විධි–මත්වීමේ වැදගත්කම. සමාජයක අධ්‍යාපන කාර්ය භාරය විධිමත් වීම සඳහා බුදු වදනෙන් ලැබෙන මග පෙන්වීම.

## ඎ අපිත් සිරිපා කළෙමු පිනිපා

– හරිශ්චන්ද්‍ර කහවල

සිරිපා වන්දනා සමය පසුගිය උඳුවප් පෝය දිනයෙන් ඇරැඹිණි. ඒ නිමිත්තෙන් පළ වන; සිරිපා පුද බිමෙහි පවිත්‍රත්වය සහ පූජනී–යත්වය රැක ගැනීම සඳහා මහජනතාව අතින් ඉටුවිය යුතු යුතුකම් පෙන්වා දීමට උත්සාහ දරන ලිපියකි. වර්තමාන ශ්‍රී ලංකා රජය මගින් ඒ පිළිබඳ මේ වන විට ක්‍රියාත්මක කර ඇති වැඩ පිළිවෙළ කිහිපයක් ගැන ද මෙම ලිපියෙන් තොරතුරු හෙළි කැරේ.